ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

පරිසර චක්‍රලේඛ - PS/FEA/Circular/4/2026

2026 මැයි මස 14 වන දින

**අමාත්‍යාංශ ලේකම්වරුන්**
**පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්**
**දෙපාර්තමේන්තු ප්‍රධානීන්**
**දිස්ත්‍රික් ලේකම්වරුන්**
**පළාත් පාලන ආයතන ප්‍රධානීන්**
**සියලුම රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්**

**ජගත් පරිසර දින සැමරුම් වැඩසටහන - 2026 ජුනි 05**

ජුනි 05 දිනය, 1972 වර්ෂයේ සිට දශක පහකට වැඩි කාලයක සිට කාලීන පාරිසරික තේමාවන් ඔස්සේ පරිසරය සංරක්ෂණය පිළිබඳව ලෝකවාසී ජනතාව දැනුවත් කිරීමට සහ ගෝලීයව පැන නගින පාරිසරික ගැටලු පිළිබඳව ලෝක නායකයින් හා ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය යොමු කරලීම පිණිස සුවිශේෂී දිනයක් ලෙස සමරනු ලැබේ. මෙවර ද එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන විසින් ජගත් පරිසර දින සැමරුම "Urgent Climate Action" යන ගෝලීය තේමාව යටතේ 54 වන වරට සැමරීමට සැලසුම් කර ඇත.

02. ඒ අනුව, 2026 ජුනි 5 වන දින පැවැත්වෙන ජගත් පරිසර දිනය, කඩිනම් දේශගුණික ක්‍රියාමාර්ග කෙරෙහි අවධානය යොමු කරමින් **හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම, පරිසර පද්ධති යථා තත්ත්වයට පත් කිරීම සහ ඉහළ යන උෂ්ණත්වය කළමනාකරණය කිරීම සඳහා ගෝලීය උත්සාහයන් වේගවත් කිරීම** අවධාරණය කරයි.

03. ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම හේතුවෙන් ඇති වී ඇති දේශගුණික විපර්යාස වර්තමානය වන විට ප්‍රධානතම මානව අභියෝගය ලෙස සමස්ත ලෝකවාසීන් විසින් හඳුනා ගෙන ඇත. මෙය මානව ක්‍රියාකාරකම් හේතුකොට ගෙන විශේෂයෙන්ම පොසිල ඉන්ධන දහනය මගින් හරිතාගාර වායු ඉතා අධික ලෙස වායුගෝලයට මුදා හැරීමේ සෘජු ප්‍රතිඵලයක් බව දේශගුණික විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය සභාව (IPCC) විසින් තහවුරු කර ඇත. එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය (United Nations Framework Convention on Climate Change) මගින් ප්‍රකාශ කර ඇති පරිදි, ඉදිරි දශක කිහිපය තුළ හරිතාගාර වායු විමෝචනය සැලකිය යුතු ප්‍රතිශතයකින් අඩු නොවුණහොත්, මෙම සියවස තුළ ගෝලීය උෂ්ණත්වය 2.9°C කින් ඉහළ යා හැකි බවත්, එමගින් පෘථිවිය මත ජීවත්වන සියලු ජීවීන්ට අහිතකර ප්‍රතිවිපාක ඇති විය හැකි බවටත් මත පළකර ඇත. එබැවින් ලොව සියලු රාජ්‍යයන් විසින් දේශගුණික විපර්යාස අවම කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුව ඇත. පුනර්ජනනීය බලශක්ති ප්‍රභව භාවිතය, බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ දැමීම, වන වගාව, කසල ප්‍රතිචක්‍රීකරණය වැනි ක්‍රියාමාර්ග හරහා බලශක්තිය, ප්‍රවාහනය, කෘෂිකර්මාන්තය, වන සම්පත් හා ඝන අපද්‍රව්‍ය යන ක්ෂේත්‍රවලින් සිදුවන කාබන් විමෝචනය අඩු කිරීම මඟින් දේශගුණික විපර්යාස අවම කර ගැනීම සහ දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීමේ හැකියාව සහිත (climate-resilient) අනාගතයක් වෙත ගමන් කිරීම අපේක්ෂා කෙරේ.

04. ශ්‍රී ලංකාව ද දේශගුණික විපර්යාසවල දැඩි බලපෑමට ලක්ව ඇති අතර අධික තීව්‍රතාවයෙන් යුතු වර්ෂාපතනයකින් පසුව ඇති වන හදිසි ජලගැලීම් හා නායයෑම්, දීර්ඝ වියළි කාලගුණික තත්ත්වයන් හේතු කොට ගෙන ඇතිවන ජල හිඟය ආදී ආන්තික කාලගුණික තත්ත්වයන් සුලභ තත්ත්වයන් බවට පත්ව ඇත. මෙම තත්ත්වය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාව තිරසර සංවර්ධන රාමුව තුළ සහ එක්සත් ජාතීන්ගේ

ගාලු මුවදොර, කොළඹ 01. காலி முகத்திடல், கொழும்பு 01. Galle Face, Colombo 01.
දුරකථන தொலைபேசி Telephones +94 (0) 11 2354420 +94 (0) 11 2473873
ෆැක්ස් தொலைநகல் Fax +94 (0) 11 2446657
ඊ - තැපැල மின்னஞ்சல் E-mail prsec@presidentsoffice.lk

දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ මූලධර්මයන්ට අනුකූලව හරිතාගාර වායු විමෝචනය අඩු කිරීමේ ගෝලීය ප්‍රයත්නයට සක්‍රියව දායක වෙමින් **"දේශගුණික විපර්යාසවල බලපෑම අවම කිරීමට ක්‍රියාත්මක වෙමු"** යන දේශීය තේමාව පෙරදැරිව පොදුවේ පරිසර සංරක්ෂණය අරමුණු කර ගනිමින් මෙවර ජගත් පරිසර දිනය සමරනු ලැබේ.

දිට්වා සුළි කුණාටුවෙන් ඇති වූ ජාතික ව්‍යසනය හමුවේ ශ්‍රී ලංකා රජය විසින් ඉහළ ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණය සහ දිගුකාලීන ඔරොත්තු දීමේ හැකියාව සහිත ක්‍රියාකාරකම්වලට ප්‍රමුඛත්වය දෙමින් මධ්‍යම කඳුකරයේ ඉහළ උන්නතාංශ පරිසර පද්ධති නැවත යථාතත්ත්වයට පත් කිරීම සහ තිරසර කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමට වැඩසටහන් සකස් කරමින් සිටියි. මෙම උත්සහයන් තුළින් අනාගත දේශගුණික කම්පනවලට එරෙහිව ස්වාභාවික ඔරොත්තු දීමේ හැකියාව සහිත පරිසර පද්ධති මෙම ප්‍රදේශවලට ඇති කරනු ලබයි.

05. ඉහත කරුණු සලකා, "ජගත් පරිසර දින සැමරුම් වැඩසටහන" යන මැයෙන් යුතුව 2016 අප්‍රේල් 28 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව ජගත් පරිසර දින ජාතික උත්සවයට සමගාමීව **"ජාතික පරිසර සතියක්"** ප්‍රකාශයට පත් කෙරේ. ඒ අනුව මැයි 30 සිට ජූනි 05 දක්වා සතිය "ජාතික පරිසර සතිය" ලෙස ප්‍රකාශයට පත් කරන අතර එම දිනයන් පහත පරිදි නම් කර ඇත.

| | |
|---|---|
| මැයි 30 | ආකල්ප ප්‍රවර්ධනය තුළින් පරිසර සංරක්ෂණය සඳහා දායකත්ව දිනය |
| මැයි 31 | පරිසර පවිත්‍රතාවය පිළිබඳ දැනුම සහ ආකල්ප ප්‍රවර්ධන දිනය |
| ජූනි 01 | දේශගුණික විපර්යාස සහ වායු දූෂණයේ බලපෑම් අවම කිරීම ප්‍රවර්ධන දිනය |
| ජූනි 02 | ජෛව විවිධත්ව සංරක්ෂණ දිනය |
| ජූනි 03 | ජලය හා ජල මූලාශ්‍ර සංරක්ෂණ දිනය |
| ජූනි 04 | වෙරළ කලාප පවිත්‍ර කිරීමේ දිනය |
| ජූනි 05 | රුක් රෝපණය හා ජගත් පරිසර දින සැමරුම |

06. ඒ අනුව, ජාතික පරිසර සතිය තුළ දී රාජ්‍ය ආයතන, පාසල්, පෞද්ගලික අංශය, වැවිලි සමාගම් හා වතු ක්ෂේත්‍ර, රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සංවිධානවල මූලිකත්වයෙන් ප්‍රජාවගේ සහභාගීත්වයෙන් පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු බව අවධාරණය කරනු කැමැත්තෙමි.

I. දේශගුණික විපර්යාස පිළිබඳව සියලු පාර්ශව දැනුවත් කිරීමට කටයුතු කිරීම.
II. ජලපෝෂක, රක්ෂිත ප්‍රදේශ, ගංගා ඉවුරු, තෙත් බිම් ප්‍රදේශ වැනි පරිසර සංවේදී භූමි හඳුනා ගැනීම හා ඒවා සංරක්ෂණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
III. හානියට පත් භූමි පුනරුත්ථාපනය, පාංශු සංරක්ෂණය හා තිරසර ඉඩම් කළමනාකරණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
IV. ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා වැඩසටහන් සංවිධානය කිරීම.
V. රාජ්‍ය ආයතන පුනර්ජනනීය බලශක්ති භාවිතයට නැඹුරු වීමට කටයුතු කිරීම.
VI. ආයතන තුළ බලශක්ති භාවිතය අවම කිරීමට පියවර ගැනීම.
VII. දිවයින පුරා පළාත් පාලන ආයතන හා ඒ යටතේ පාලනය වන ආයතනවල බලශක්තිය කාර්යක්ෂමව භාවිතය පිළිබඳව දැනුවත් කිරීම.
VIII. කාර්යාල ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී හැකි සෑම අවස්ථාවකදීම හරිත නිෂ්පාදන (පරිසර සහතිකලත්, හරිත ලේබල්කරණය කරන ලද) මිල දී ගැනීමට ප්‍රමුඛතාව දීම.
IX. කඩදාසි භාවිතය අඩු කර ඒ වෙනුවට විද්‍යුත් හෝ ඩිජිටල් මාධ්‍ය භාවිතා කිරීමට කටයුතු කිරීම.
X. දිවයින පුරා පළාත් පාලන ආයතනවල මූලිකත්වයෙන් එම පළාත් පාලන බල ප්‍රදේශ තුළ, පරිසරය පවිත්‍ර කිරීම, ඉවත දමන ලද ප්ලාස්ටික් / පොලිතීන් එකතු කිරීම, කසළ වර්ගීකරණය හා කසළ කළමනාකරණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර පවත්වාගෙන යාම.

XI. නිවසේ දී, කාර්යාලයේ දී සහ පාසලේ දී ඉවත දමන ලද ප්ලාස්ටික් එකතු කර ඒවා කසල එකතු කිරීමේ මධ්‍යස්ථානවලට යොමු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

XII. තම ආයතන පරිශ්‍රයන් තුළ පවත්වනු ලබන රැස්වීම්,වැඩමුළු සඳහා ප්ලාස්ටික් ජල බෝතල් භාවිතය අවම කිරීමට පියවර ගැනීම.

XIII. වෙරළ තීරයේ තුරු ආවරණය වැඩි කිරීමට හා කඩොලාන සංරක්ෂණයට ක්‍රියාමාර්ග ගැනීම.

XIV. පරිසර සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.

XV. පරිසර සංරක්ෂණයට අදාල නීති පිළිබඳ දැනුවත් කිරීම.

07. සෑම ආයතනයක් විසින් ම ඉහත යෝජිත පරිදි සුදුසු පරිසර සංරක්ෂණ වැඩසටහන් ජාතික පරිසර සතිය තුළ දී ඉටුකිරීම සඳහා පූර්ව සැලසුම් සකස් කර දේශපාලන නායකත්වයේ ද සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ.

08. මෙරට තරුණ ප්‍රජාව පාරිසරික සංරක්ෂණ ක්‍රියාමාර්ග කෙරෙහි දායක කරගැනීමට රජය මේ වන විට අවධානය යොමු කර ඇති බැවින්, මෙම කාර්යයන් සඳහා හැකි සෑමවිටම තරුණ ප්‍රජාව සහභාගී කර ගැනීමට කටයුතු කිරීම සුදුසු බව අවධාරණය කරමි.

09. ජාතික පරිසර සතිය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රගතියේ මෘදු පිටපත pedudivision@gmail.com විද්‍යුත් ලිපිනය මගින් පරිසර අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කළ යුතුය.

10. ඉදිරි වර්ෂයන්හි දී ජාතික පරිසර සතිය ක්‍රියාත්මක කිරීම සහතික කරනුවස් එම වැඩසටහන් තම ආයතනවල, දිස්ත්‍රික්කවල හෝ පළාත්වල වාර්ෂික සැලසුම්වලට ඇතුළත් කර ගැනීමට ක්‍රියාකරන මෙන් ද කාරුණිකව දන්වා සිටිමි.

11. මෙම කාර්යයන් සිදු කිරීමේ දී රජය විසින් මේ වන විට ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණ හා නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රතිපාදනවලට අනුකූලව ක්‍රියාකළ යුතු බව ද දන්වමි.

පරිසර සංවේදී ප්‍රජාවක් බිහිකිරීම සඳහා ඔබගේ සක්‍රීය දායකත්වය හා සහයෝගය අපේක්ෂා කරමි.

ආචාර්ය එන්. එස්. කුමානායක
ජනාධිපති ලේකම්

පිටපත් :

01. අග්‍රාමාත්‍ය ලේකම් - කරු. දැ.ගැ.ස.

02. අමාත්‍ය මණ්ඩල ලේකම් - කරු. දැ.ගැ.ස.